# නිතර අසන පැන

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## 2021 ඔක්තෝබර් 28 දිනැති අංක 2251/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති 1949 අංක 58 දරන මුදල් නීති පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති.

මූලික වශයෙන්ම රටෙහි විදේශ වෙළෙඳාමට පහසුකම් සැලසීමේ අපේක්ෂාවෙන් දේශීය වෙළෙඳපොලේ විදේශ මුදල් ද්‍රවශීලතාවය වර්ධනය කිරීම සහ විනිමය අනුපාතය ස්ථාවර කිරීම සඳහා මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද සංශෝධිත රීතින්ට අදාළව බැංකු සහ වෙනත් පාර්ශවකරුවන්ගේ පොදු ගැටළුවලට පැහැදිලි කිරීමක් ලෙස පහත "නිතර අසන පැන" සහ පිළිතුරු සකස් කර ඇත.

**1. "2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" (රීති) සඳහා අදාළ විෂය පථය කුමක්ද?**

i. 2021 ඔක්තෝබර් 28 දිනට හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවට ලැබෙන සියළුම අපනයන ඉපැයීම් සඳහා මෙම රීති අදාළ වේ.

ii. ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකුට අපනයනය කරනු ලබන භාණ්ඩ සහ සපයන වෘත්තීය හෝ ව්‍යාපාරික සේවා ඇතුලු සේවා අපනයනකරුවන්ට මෙම රීතින් අදාල වේ. මෙම අපනයන ඉපැයීම් ලැබීම සඳහා වන ගිණුම් බලපත්‍රලාභී වාණිජ බැංකු වල දේශීය බැංකු ඒකකයෙහි හෝ අක්වෙරළ බැංකු ඒකකයෙහි පවත්වා ගත හැකිය.

iii. අපනයන බිල්පත් මිලදී ගැනීම්වලින් ලැබෙන ආදායම (බිල්පත් වට්ටම් කිරීම), අපනයන ඉපැයීම් ලෙස සැළකේ.

iv. අන්තරාල වෙළෙඳ (Entrepot trade) ගනුදෙනු සම්බන්ධයෙන් නේවාසික පුද්ගලයින්ට ලැබෙන ආන්තික/කොමිස් ආදායම සේවා අපනයනය මගින් ලැබෙන ඉපැයීම් ලෙස සැලකේ.

v. නේවාසික භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් මෙන්ම නැව්ගත කිරීමේ/ගුවන් සේවා සැපයීමේ නියෝජිතයන් විසින් එම සේවාවන් අනේවාසිකයින්ට සැපයීමෙන් ලබන නියෝජිතායතන කොමිස් වැනි විදේශ මුදල් ඉපයීම් මෙම රීතීන්ට යටත් වේ.

**2. විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින් විසින් කරනු ලබන සේවක ප්‍රේෂණ මෙම රීතීන්ට යටත් වේ ද?**

විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් විසින් රටට එවන ලද මුදල් (සේවක ප්‍රේෂණ) සඳහා මෙම රීතීන් අදාළ නොවේ. තවද, ශ්‍රී ලංකාවෙන් අපනයනයන් සිදු නොවන, හුදෙක්ම රැස් කිරීමේ අරමුණින් පමණක්ම අක්වෙරළ බැංකු ඒකක තුළ පවත්වාගෙන යනු ලබන ගිණුම් වෙත, අනේවාසිකයන් විසින් ලබන ආදායම ද මෙම රීතීන්ට යටත් නොවේ.

**3. අපනයනය කළ දින සිට දින 180 ක් ඇතුලත පවතින සහ දින 30 ක් ගතවී නොමැති, 2021 ඔක්තෝබර් 28 දිනට පෙර ලැබී ඇති අපනයන ඉපැයීම්, මේ දක්වා පරිවර්තනය කර නොමැති අවස්ථාවකදී මෙම රීතියෙහි අදාළත්වය කුමක්ද?**

2021 ඔක්තෝබර් 28 දින වන විට මෙරටට ලැබී ඇති අපනයන ඉපැයීම් දැනටමත් පරිවර්තනය කර නොමැති නම්, 2021 මැයි 28 දිනැති ගැසට් නිවේදන අංක 2229/9 න් ප්‍රසිද්ධියට පත් කරන ලද 2021 අංක 4 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති යටතේ දක්වා ඇති පරිවර්තන අවශ්‍යතාවයට (අපනයන ආදායමෙන් 25% ක් අනිවාර්යයෙන් පරිවර්තනය කිරීම) යටතේ වේ.

**4. අවසරලත් ගෙවීම් සඳහා අපනයනකරුවන්ට ලැබෙන අපනයන ආදායමෙන් 100% ක් දක්වා විය හැකි බැවින් රීතීන්ට අනුව පරිවර්තනය කළ යුතු අවම ශේෂයක් තිබේද?**

මෙම රීති යටතේ අවම පරිවර්තන අවශ්‍යතාවයක් දක්වා නොමැත. කෙසේ වෙතත්, රීතිවලට අනුකූලව අවසරලත් ගෙවීම් සිදු කිරීමෙන් පසුව, යම් ලිත් මාසයක් තුළ ලැබුණු ආදායමෙන් ඉතිරි වන සම්පූර්ණ ශේෂය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම බැංකු විසින් සිදු කළ යුතු වේ.

**5. රීතියෙහි අයිතම 4 iv අනුව "එක් මසක වගකීම්" යටතට ණය ආපසු ගෙවීම් සහ සංචාරක අරමුණු අදාළ කරගත හැකිද?**

නොහැක. එක් මසක වගකීම් අදාළ වනුයේ භාණ්ඩ හා සේවා අපනයනය සඳහා සෘජුවම සම්බන්ධිත භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා පමණී.

එක් මසක වගකීම් පියවීමේදී දින 180 ක කාල පරාසය අදාළ නොවන අතර, එක් මසක් ඇතුළත භාවිතයට නොගත් අපනයන ඉපැයීම් පරිවර්තනය කිරීම බැංකු විසින් සිදු කළ යුතු වේ.

**6. පාරිභෝගිකයාගේ ඉල්ලීම මත අපනයන ඉපැයීම් පරිවර්තනය කිරීම සඳහා වෙනත් බැංකුවකට ප්‍රේෂණය කළ හැකිද?**

නොහැක. අවසරලත් ගෙවීම්වලට අවසර ලබා දීමෙන් පසුව ශ්‍රී ලංකාවේ අපනයන ඉපැයීම් ලද බැංකුව විසින් ශේෂය පරිවර්තනය කිරීම කළයුතු වේ. වෙනත් බැංකුවලට හෝ වෙනත් විදේශ මුදල් ගිණුම්වලට මාරු කිරීම, එම අවසරලත් ගෙවීම්වල වටිනාකම දක්වා පමණක් සිදු කළ හැක .

**7. කාර්තුමය සහ අර්ධ වාර්ෂික පදනමින් පියවිය යුතු වාරික ණය හෝ ප්‍රාග්ධන වියදම් හෝ මුදල් ආන්තික හෝ පහසුකම් සුරක්ෂිත කිරීම වෙනුවෙන් විදේශ මුදල් ශේෂයන් ගොඩනගා ගැනීම සඳහා කිසියම් පාරිභෝගික ඉල්ලීමකට බැංකුවට ඉඩ සැලසිය හැකිද?**

මෙම රීති බලාත්මක වන දින සිට කිසිදු අරමුණක් වෙනුවෙන් අපනයන ඉපැයීම් රැස් කිරීමට අවසර නොමැත.

**8. රීති යටතේ බැංකුව විසින් අපනයන ඉපැයීම් පරිවර්තනය කිරීම සඳහා ඊළඟ මාසයේ 7 වන දා වන විට පාරිභෝගික උපදෙස් නොලැබුනේ නම්, කුමක් කළ යුතුද?**

අපනයනකරුගේ ලේඛනගත සාක්ෂි නොමැති අවස්ථාවලදී බැංකුව විසින් අපනයන ඉපැයීම් නියමිත දිනට පරිවර්තනය කළ යුතුය. අවසරලත් ගෙවීම් සහ/හෝ වගකීම්වල සත්‍යතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය සහ ප්‍රමාණවත් ලේඛනගත සාක්ෂි ලබා ගැනීමේ හෝ සැපයීමේ වගකීම අදාළ බැංකුව සහ අපනයන කරු වෙත පැවරී ඇත.

**9. දින 180 කට පසුව ලැබිය හැකි අපනයන ඉපැයීම් සම්බන්ධව බැංකුව කටයුතු කළ යුත්තේ කෙසේද?**

දින 180 ක නියමිත කාලසීමාව තුළ අපනයන ඉපැයීම් රැගෙන නොඒම සම්බන්ධයෙන් මහ බැංකුවට වාර්තා කළ යුතු අතර, රීතින්ට අනුව එවැනි උල්ලංඝනය කිරීම්/අනුකූල නොවීම්වලට එරෙහිව මහ බැංකුව විසින් ක්‍රියාමාර්ග ගනු ලැබේ. එවැනි අපනයන ඉපැයීම් ලද වහාම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය.

**10. ගනුදෙනුකරුවන්ට සේවා අපනයනයෙන් ලැබෙන ඉපැයීම් විවිධ බැංකුවල තමන්ගේම විදේශ ගිණුම්වලට මාරු කළ හැකිද?**

නොහැක. අපනයන ඉපැයීම් ලබන බැංකුව සේවා අපනයන ඉපැයීම් සම්බන්ධයෙන් වන රීතින්ට අනුකූලව කටයුතු කළ යුතුය.

**11. රීති අනුව, අවසරලත් ගෙවීම් යටතේ දේශීය සැපයුම්කරුවන්ට ගෙවීම් සිදු කළ හැකිද?**

1949 අංක 58 දරන මුදල් නීති පනතට අනුව දේශීය සැපයුම්කරුවන් සඳහා වන සියළුම ගෙවීම් ශ්‍රී ලංකා රුපියල්වලින් විය යුතුය. කෙසේ වෙතත්, පහත අවස්ථා වලදී දේශීය සැපයුම්කරුවන් වෙත විදේශ මුදලින් කරන ගෙවීම්, රීතියෙහි අයිතම 4 iv යටතේ දක්වා ඇති අවසරලත් ගෙවීම් ලෙස සැලකිය හැක.

i. අපනයනකරුවෙකු දේශීය සැපයුම්කරුවෙකුගේ ආනයනික අමුද්‍රව්‍ය භාවිතා කරමින් තම අවසාන අපනයනය සිදු කර ඇති අවස්ථාවකදී, එකී ආනයනික අමුද්‍රව්‍ය වෙනුවෙන් කරන ගෙවීම්.

ii. අපනයනකරුවෙකුට භාණ්ඩ සැපයීම වෙනුවෙන් දේශීය සැපයුම්කරුවෙකු විසින් විදේශ මුදලින් ලබා ගත් ණය ආපසු ගෙවීම වෙනුවෙන් කරන ගෙවීම්.

**12. අපනයන ආදායමෙන් 100% ප්‍රතිශතයක් දක්වා අපනයන සම්බන්ධ ණය ප්‍රදානය කිරීමට බැංකුවට හැකියාවක් තිබේද?**

එවැනි ණය ලබා ගැනීමට පාරිභෝගිකයන්ට සත්‍ය අවශ්‍යතාවයක් ඇත්දැයි ඔවුන්ගේ පෙර ගනුදෙනු වාර්තා, වෙළඳපොල භාවිතයන් සහ පවත්නා ආර්ථික තත්ත්වයන්ට අනුකූලව බැංකුව විසින් තක්සේරු කළ යුතුය.

රීති යටතේ ඇති අවශ්‍යතා මග හරිමින් බැංකු විසින් විදේශ මුදල් වලින් ණය පහසුකම් ලබා දීම සිදු නොකළ යුතුය.